# ගෙදර සිට ඉගෙනගන්නා සිසුවකුට උදව් කරන පාසලක්



එය කුරුණෑගල දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශයකට තරමක් දුරින් නිස්කලංක ගම්මානයක සුන්දර පරිසරයක පිහිටි සන්සුන් කුඩා පාසලකි. අ.පො.ස. සාමාන්‍ය පෙළ දක්වා පන්ති පැවැත්වෙන හුදකලා පාසලක් වන එහි ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව තරමක් අඩුය.

පාසලේ අන්තකර්රණ අධ්‍යාපන වැඩසටහනට ඉතා උනන්දුවෙන් නායකත්වය ලබාදෙන විදුහල්පතිනියක අපට එම පාසලේදී හමු විය. ඇය පාසල විසින් මෙහෙයවනු ලබන අන්තකර්රණ අධ්‍යාපන වැඩසටහන පාසල් වාෂරීක සැලැස්මට ඇතුළත් කර කලාප කායර්ාලයේ අනුමැතිය ද ලබාගෙන තිබේ.

මෙම පාසලට නුදුරින් පිහිටි ළමා නිවාසයක නැවතී සිටින ළමයින් 20 දෙනෙකුට ද මෙම පාසල අධ්‍යාපනය ලබාදෙන බව විදුහල්පතිනිය පැවසුවාය. "සමහර අය විවිධ හේතු නිසා පරිවාස භාරයේ ඉන්න ළමයි. ඔවුන් කිසිවෙකු මේ ප්‍රදේශයේ අය නොවෙයි. මෙය ඔවුන්ගේ ළමා නිවසට ආසන්නතම පාසලයි. මේ පාසල උණුසුම් ලෙස ඔවුන් පිළිඅරගෙන ඇතුළත් කරගන්නවා," යි ඇය පැවසුවාය.

කායික හා බුද්ධිමය දුබලතා සහිත ළමයින් සිව්දෙනෙකු පාසලේ ඉගෙනුම ලබන බව විදුහල්පතිතුමිය අප සමඟ පැවසුවාය. පාසලෙහි විශේෂ අධ්‍යාපන ඒකකයක් හෝ විශේෂ අධ්‍යාපනය පිළිබඳ පුහුණුව ලත් ගුරුවරුන් නොමැත. කෙසේ වෙතත්, විශේෂ අධ්‍යාපන ඒකකයක් ඇති දුර බැහැර පාසලකට ළමයින් යැවීමට දෙමාපියන්ට හැකියාවක් නොමැති නිසා මෙම පාසල එවැනි ළමයින්ට අඛණ්ඩව උපකාර කරයි. "අපි විශේෂ අධ්‍යාපන ඒකක ඇති පාසල් සමඟ එක්ව කටයුතු කර ඔවුන්ගේ සහයෝගය ලබා ගැනීමට උත්සාහ කරනවා," යි විදුහල්පතිවරිය පැවසුවාය.

මාංශ පේශි දුවර්ල වීමට හේතු වන ජානමය රෝගී තත්ත්වයකින් පෙළෙන බැවින් චලනය දුෂ්කර එක් සිසුවෙකු මේ වන විට පාසලට පැමිණෙන්නේ නැත. පසුගිය වසරේ මෙම සිසුවා 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිට එයින් සමත් විය. "එතකොට එයා අවුරුදු එකහමාරක්ම පාසල් ඇවිත් ඍජුව පාඩම්වලට සහභාගී වී තිබුණේ නැහැ. ඔහුගේ වැඩිමහල් සොහොයුරිය මෙම පාසලේ 11 ශ්‍රේණියේ ඉගෙනුම ලබමින් සිටියා. අප ඔහු සමඟ ප්‍රධාන වශයෙන් සම්බන්ධ වූයේ ඇය හරහායි. ගුරුවරු හැකි හැමවිටම ඔහු බැලීමට ගිහින් උදව් කළා. ඔහුට පාඩම් යොමු කළේ ඔහුගේ සහෝදරිය මාගර්යෙනුයි. ඔහුගේ අභ්‍යාස පාසලට ගෙන්වාගෙන ගුරුවරුන් ඒවා පරීක්ෂා කළා. අවශ්‍ය උපදෙස් පොත්වල සටහන්

කර ආපසු යැව්වා. පාසල ඔහුට පෙළ පොත් සහ අනෙකුත් පහසුකම් ලබා දුන්නා. විභාග දෙපාතර්මේන්තුව විභාගයට පෙනී සිටීමේදී ඔහුට විභාග මධ්‍යස්ථානයක අමතර පහසුකම් ලබා දුන්නා,'' යි විදුහල්පතිවරිය විස්තර කළාය.

''මෙම සිසුවා දැන් 6 ශ්‍රේණියේ ඉගෙනුම ලබනවා. එහෙත්, රෝගී තත්වය නිසා තවමත් ඔහුට පාසලට පැමිණිය නොහැකියි. කෙසේ වෙතත්, ඔහුගේ අධ්‍යාපන අයිතිය අප සහතික කළ යුතුයි. අපට මෙහි ජංගම ගුරුවරුන් නැහැ. නමුත් අපි ඔහුට අධ්‍යාපනය ලබා දීමට උත්සාහ කළ යුතුයි. දැන් ඔහුගේ සොයුරිය අපේ පාසලින් ඉවත් වී වෙනත් පාසලක උසස් පෙළ විභාගයට ඉගෙන ගන්නවා. ඒ නිසා දැන් ඔහු සමඟ සම්බන්ධ වීම තරමක් අපහසුයි. කෙසේ වෙතත්, අපි දැනටමත් ඔහුට පාසල් පෙළ පොත් සහ ඉගෙනුම් උපදෙස් යවා තිබෙනවා. අපි ඔහුට උදව් කරන්න ක්‍රම හොයනවා,'' යි විදුහල්පතිනිය වැඩිදුරටත් පැවසුවාය.

පාසල මෙම ශිෂ්‍යයා වෙනුවෙන් ගෙදර සිට කරනු ලබන අධ්‍යාපනය සහ දුරස්ථ ඉගෙනීමේ ක්‍රමවල මිශ්‍ර ප්‍රවේශයක් භාවිතා කිරීමට උත්සාහ කරන බව දක්නට ලැබිණි.

මෙම සිසුවාට රෝද පුටුවක් වැනි ආධාරක උපකරණ ලබා දීම සඳහා විදුහල්පතිවරිය ප්‍රජාව වෙතින් උපකාර ලබාගෙන ඇත. ඇයට පෙර පාසලේ සේවය කළ විදුහල්පතිවරයාගේ කාලයේදීම පාසල් පරිශ්‍රය තුළට දුබලතා සහිත සිසුන්ගේ ප්‍රවේශවීමේ හැකියාව වැඩි දියුණු කර ඇත. දුබලතා සහිත සිසුන්ට ප්‍රාථමික පන්ති කාමර වෙත ළඟාවීම පහසු කිරීම සඳහා පාසල තුළ අලුතින් අතුරු මාගර්යක් ඉදිකර ඇත. දැන් ප්‍රාථමික පන්ති කාමරවල දොර අසලටම සිසුවෙකුට වාහනයකින් පැමිණිය හැකිය.

විවිධ විශේෂ අවශ්‍යතා ඇති සිසුන් එකම පන්ති කාමරයක ඉගෙන ගන්නා ආකාරය අපි නිරීක්ෂණය කළෙමු. විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන් හට වෙන වෙනම අවධානය යොමු කිරීමට ගුරුවරු උපරිමයෙන් උත්සාහ කරති.

"සියලු සම වයසේ මිතුරන්ට එක හා සමානව සැලකීමට අපි සිසුන්ට පුරුදු කර තිබෙනවා. සිසුන් අතර හිරිහැර කිරීම් හා වෙනස්කම් කිරීම් දැන් පෙනෙන්නට නැහැ," යි අන්තකර්රණ අධ්‍යාපන සම්බන්ධීකාරක ගුරුවරිය පැවසුවාය. අප ඇය හමුවීමට යන විට ද ADHD තත්වයේ පිරිමි ළමයෙකුට වෙනම පාඩමක් කරමින් සිටියාය.

මෙම කුඩා පාසල අන්තකර්රණ අධ්‍යාපනය ප්‍රවධර්නය කිරීම සඳහා පාසලට හැකි සෑම දෙයක්ම කරයි. අන්තකර්රණ අධ්‍යාපනය පිළිබඳ දැඩි උනන්දුවක් දක්වන විදුහල්පතිනිය පාසලේ අන්තකර්රණ අධ්‍යාපනික ප්‍රතිපත්ති අවබෝධ කර ගැනීම සඳහා ගුරුවරුන්ට, සිසුන්ට සහ පාසල් ප්‍රජාවට මනා නායකත්වයක් සපයයි.